## පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

## புடவைக் கைத்தொழில் திணைக்களம்

## DEPARTMENT OF TEXTILE INDUSTRY

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயற்பாட்டு அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2017

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் வணிக அமைச்சு

MINISTRY OF INDUSTRY AND COMMERCE

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

புடவைக் கைத்தொழில் திணைக்களம்

DEPARTMENT OF TEXTILE INDUSTRY


**3 වන මහල, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත, කොළඹ 10**

**3 ஆம் மாடி, செயலகக் கட்டிடம், மாளிகாவத்தை, கொழும்பு 10**

3rd Floor, Secretariat Building, Maligawatta, Colombo 10

# පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

## 01 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂ කර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

### 1.1 දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

### 1.2 මෙහෙවර

**රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.**

## 1.3 අරමුණු

- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම
- නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම
    - ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
    - මෝස්තර සම්පාදන වැඩසටහන්
    - පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම
- ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම
- අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම
- ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදාබැලීම් හා සංරක්ෂණ කටයුතු
- නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

**i) පර්යේෂණ, පුහුණු,මෝස්තර හා සේවා ආයතනය**
**280/1, ගාලු පාර, කටුබැද්ද, මොරටුව**



**ii) ස්වාභාවික වර්ණ ව්‍යාපෘතිය, රාජගිරිය**

### iii) පේෂකර්මාන්ත පුහුණු පාසැල් සහ මෝස්තර පුහුණු පාසල්

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසල් 14 ක් සහ මෝස්තර පුහුණු පාසල් 2 කි.

| අනු අංකය | ආයතනය | ලිපිනය |
|---|---|---|
| 01 | පෙහෙකම් සිප් පියස, කටුබැද්ද | 280/1,ගාලු පාර, කටුබැද්ද, මොරටුව |
| 02 | පෙහෙකම් සිප් පියස, කොට්ටල | කොට්ටල, වේයන්ගොඩ |
| 03 | පෙහෙකම් සිප් පියස,බෝයගනේ | බෝයගනේ, කුරුණෑගල |
| 04 | පෙහෙකම් සිප් පියස,පින්නවල | පින්නවල, රඹුක්කන |
| 05 | පෙහෙකම් සිප් පියස, වටපුළුව | අරුප්පල පාර, වටපුළුව,මහනුවර |
| 06 | පෙහෙකම් සිප් පියස,ගැටඹේ | ගැටඹේ, පේරාදෙණිය |
| 07 | පෙහෙකම් සිප් පියස,මාතලේ | කෝන්ගහමුල,පලාපත්වල,මාතලේ |
| 08 | පෙහෙකම් සිප් පියස,මාතර | හක්මන පාර, මාතර |
| 09 | පෙහෙකම් සිප් පියස,කිරම | කිරම |
| 10 | පෙහෙකම් සිප් පියස,බණ්ඩාරවෙල | කිණිගම, බණ්ඩාරවෙල |
| 11 | පෙහෙකම් සිප් පියස,තලාව | මිහිරිගම, තලාව |
| 12 | පෙහෙකම් සිප් පියස,ගාල්ල | කලේගාන පාර, ගිංතොට, ගාල්ල |
| 13 | පෙහෙකම් සිප් පියස,නල්ලූර් | 194,පේදුරුතුඩුව පාර,නල්ලූර්,යාපනය |
| 14 | පෙහෙකම් සිප් පියස,සමන්තුරේ | සමන්තුරේ |
| 15 | මෝස්තර පුහුණු පාසල,කටුබැද්ද | 280/1,ගාලු පාර, කටුබැද්ද, මොරටුව |
| 16 | මෝස්තර පුහුණු පාසල,ගැටඹේ | ගැටඹේ, පේරාදෙණිය |







**2017/12/31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | | | |
| අධ්‍යක්ෂ | 01 | 01 (වැ.බ.) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 02 | 01 | 01 |
| ගණකාධිකාරී | 01 | 01 | 0 |
| පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ | 01 | 01 | 0 |
| | | | |
| | | | |
| පරිපාලන නිලධාරී | 01 | 0 | 01 |
| කාර්මික නිලධාරී | 01 | 01 | 0 |
| සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරී | 08 | 08 | 0 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 10 | 10 |
| පේෂ උපදේශක | 61 | 53 | 08 |
| නිමහම් සහකාර } තනතුරු අහෝසිකර ඇත | 01 | 01 | 0* |
| චිත්‍ර ප්‍රදර්ශක | 18 | 09 | 0* |
| | | | |
| | | | |
| රියැදුරු | 05 | 05 | 0 |
| කාර්යාල කාර්ය සහයක | 10 | 03 | 07 |
| මුරකරු | 18 | 18 | 0 |
| කම්කරු | 09 | 08 | 01 |
| එකතුව | **157** | **119** | **-** |

**<u>නව බඳවා ගැනීම් හා විශ්‍රාම ගැනීම්</u>**

2017 වර්ෂය තුළ පහත සඳහන් පරිදි නිලධාරීන් බඳවා ගැනීම්, විශ්‍රාම ගැනීම් සිදුවී ඇත.

| බඳවා ගැනීම් **(08)** | විශ්‍රාම ගැනීම් **(07)** | මුදාහැරීම් **(01)** |
|---|---|---|
| **පේෂ උපදේශක (07)** | රාජ්‍ය කළමනාකරණ සහකාර (01) | පේෂ උපදේශක (01) (මධ්‍යම පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත) |
| මුරකරු **(01)** | පේෂ උපදේශක (03) | |
| | චිත්‍ර ප්‍රදර්ශක (02) | |
| | කාර්යාල සේවක සේවය (01) | |

# 02 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

## 2.1 ප්‍රතිපාදන උපයෝජනය

2017 වර්ෂයේ සළසා තිබූ ප්‍රතිපාදන පහත පරිදි ප්‍රතිශතයන්ගෙන් උපයෝජනය කර තිබුණි.

- මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 95 %

  මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 67 %

| වැය විෂය | | මුළු ශුද්ධ වෙන් කිරීම **(2017වර්ෂය)** (රු:) | මුළු වියදම (රු:) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (රු:) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | | |
| **1001** | වැටුප් හා වේතන | 34,274,000 | 33,339,685 | 934,315 | **97%** |
| **1002** | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,150,000 | 1,122,530 | 27,470 | **98%** |
| **1003** | වෙනත් දීමනා | 24,000,000 | 23,044,290 | 955,710 | **96%** |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 61,390,000 | 57,674,074 | 3,715,926 | **93%** |
| | | | | | |
| | මූලධන වියදම් | | | | |
| **2001** | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5,000,000 | 2,552,067 | 2,447,933 | **51%** |
| **2003** | වාහන | 650,000 | 579,532 | 70,468 | **89%** |
| **2102** | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 1,300,000 | 1,294,338 | 5662 | **100%** |
| **2401** | පුහුණුකිරීම් සහ හැකියා වර්ධනය | 29,500,000 | 20,082,614 | 9,417,386 | **68%** |

## 2.2 ආදායම් ගිණුම්

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සේවා සපයන ආයතනයක් බැවින් විශේෂ ආදායම් නොමැත.

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කාර්යසාධනය

| | උපරිම හර සීමාව රු: | අවම ලැබීම් සීමාව රු: | උපරිම හර ශේෂ සීමාව රු: |
|---|---|---|---|
| වාර්ෂික විසර්ජන ගිණුමේ සීමාවන් අමාත්‍ය මණ්ඩලය විසින් සංශෝධිත සීමාව(30301) | 5,500,000 | 3,200,000 | 30,000,000 |
| වාර්ෂික සත්‍ය වියදම 303011 | 5,150,599.00 | 3,644,700.32 | 14,273,854.68 |
| 303012 | 224,559.00 | 835,183.00 | |

## 3. වාර්ෂික කාර්යසාධනය

### 3.1 ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීමේ කටයුතු

- කටුබැද්ද,අධ්‍යක්ෂ නිල නිවසේ ප්‍රතිසංස්කරණ කටයුතු
- කටුබැද්ද, බෝයගනේ, සමන්තුරේ, කිරම, මාතර පේෂ කර්මාන්ත පුහුණු පාසල්හි අලුත්වැඩියා කටයුතු
- කටුබැද්ද පරිශ්‍රයේ වෙනත් සංවර්ධන කටයුතු
- රාජගිරිය ස්වාභාවික වර්ණ මධ්‍යස්ථාන පරිශ්‍රයේ ඉදිකිරීම්
- නුවරඑළිය ශාන්තිපුර සංචාරක නිවාසයේ අලුත්වැඩියා කටයුතු

### 3.2 බලවේග අංශය සම්බන්ධ කටයුතු

දෙපාර්තමේන්තුව සතුව තිබී පෞද්ගලික අංශයට විකුණනු ලැබ ඇති බලවේග ආයතන සම්බන්ධයෙන් වන කටයුතු හා එම ආයතනවල සිට රැකියා අහිමි වූ විශ්‍රාම වැටුප් හා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු වේ.

1980/81/82 වර්ෂවල පෞද්ගලීකරණය කරන ලද පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් බලවේග ව්‍යාපාරවල වසර 10කට අඩු කාලයක් සේවය කළ සේවකයන්ට වන්දි මුදලක් ගෙවීම සඳහා අංක 12/0865515/004-1 හා 2012-07-12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ වන්දි මුදල් ගෙවීමේ කටයුතු අවසන් කර ඇත.

2017 වර්ෂයේදී වන්දි මුදල් ලබා දෙන ලද මුළු සේවක සංඛ්‍යාව 387 ක් වන අතර රු: 36,342,000.00 ක මුදලක් වන්දි වශයෙන් ලබා දී ඇත.

### 3.3 පේෂකර්මාන්ත පුහුණු ව්‍යාපෘති

* පේෂකර්මාන්ත පුහුණු පාසැල් වලට සිසුන් බඳවාගෙන පුහුණු කිරීම

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසැල් 14 ක් මඟින් පවත්වන පේෂකර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි.

ඒ අනුව 2016/2017 අධ්‍යයන වර්ෂය (2016-07-04 සිට 2017-07-31 දක්වා) සඳහා සිසුන් 157 දෙනෙකු බඳවා ගන්නා ලද අතර 2017/2018 අධ්‍යයන වර්ෂය (2017-07-03 සිට 2018-07-31 දක්වා) සඳහා 2017 ජූලි මස බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව **192** කි.

*  පේෂකර්මාන්ත මෝස්තර පුහුණු පාසැල් වලට සිසුන් බඳවාගෙන පුහුණු කිරීම

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක මෝස්තර පුහුණු පාසැල් දෙකකි. 2017 අධ්‍යයන වර්ෂය සඳහා 2017 ජනවාරි මාසයේදී ගැටඹේ මෝස්තර පුහුණු පාසලට සිසුන් 08 ක් හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසලට සිසුන් 13 ක් ඇතුළත් විය. දෙපාර්තමේන්තුවේ පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගය සමතුන් මෝස්තර පුහුණු පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් ලබයි.

## 4 අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

*  අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි සල්පිල

දේශීය අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත නිෂ්පාදකයින් සඳහා වෙළඳපල අවස්ථා උදාකරදීමෙන් ජනතාව අතර අත්‍යන්ත්‍ර රෙදිපිළි ජනප්‍රිය කිරීමත් ඒ සඳහා වැඩි ඉල්ලුමක් ඇති කිරීමත් අරමුණු කර ගෙන 2017 මාර්තු මස 07 - 09 දිනයන්හිදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේදී පවත්වන ලදි.






* ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල

අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කරන අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා වාර්ෂිකව පවත්වන ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල 2017 දෙසැම්බර් මස 15 – 17 දිනයන්හි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේදී පවත්වන්නට යෙදින.
















* අත්යන්ත්‍ර රෙදිපිළි විලාසිතා දැක්ම

අත්යන්ත්‍ර රෙදිපිළි කලාව ජනතාව අතර ප්‍රචලිත කිරීම, විදේශීය වෙළඳපල සඳහා නව අත්යන්ත්‍ර නිර්මාණ හඳුන්වාදීම මෙන්ම වෙළඳපල අවස්ථා පුළුල් කරලීමේ අරමුණෙන් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව 2017 දෙසැම්බර් මස 15 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේදී පවත්වන්නට යෙදුණු අත්යන්ත්‍ර රෙදිපිළි විලාසිතා දැක්ම තුළින් වෙනස් වන විලාසිතා ලෝකයේ නව අත්දැකීම් ලබා ගැනීමට නිර්මාණකරුවන්ට අවස්ථාව සළසා දෙන ලදි.








## 5 සේවාස්ථ පුහුණු වැඩසටහන

I. පේෂකර්මාන්ත කළමණාකරුවන්, ව්‍යවසායකයින් හා උපදේශකයින් දක්වා විහිදී යන පරිදි පේෂකර්මාන්තයේ වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික අංශයේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් 2017 වර්ෂයේදී පුහුණුලාභීන් 978 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 39ක් පවත්වන ලදි.

(පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන් 19ක්, නිපුණතා සංවර්ධන වැඩසටහන් 05ක්, පේෂ පාසල් සිසුන් සඳහා පෞරුෂත්ව වැඩසටහන් 03ක්, අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තයට අදාළ විදේශ පුහුණු වැඩසටහන් 02ක් හා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා 10 ක් වශයෙනි)





## පුහුණු වැඩමුළු - 2017
### පැවැත්වූ පාඨමාලා පිළිබඳ විස්තර

| අනු අංකය | පාඨමාලාවේ නම | පැවැත්වූ දිනය | දින ගණන | පැවැත්වූ ස්ථානය/සහභාගීත්වය | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2017.03.03 | 1 | ප්‍රධාන කාර්යාලය | 36 |
| 2 | නවක නිලධාරීන් සඳහා වන කාර්ය ප්‍රමුඛතා වැඩසටහන | 2017.03.06 - 2017.03.17 | 10 | කටුබැද්ද අංශය | 7 |
| 3 | පේෂකර්ම උපදේශක නිලධාරීන්ගේ කාර්යක්ෂමතා ඉහළනැංවීමේ වැඩසටහන | 2017.03.06 - 2017.03.08 | 3 | කටුබැද්ද අංශය | 20 |
| 4 | නූල් සුදු කිරීම සහ වර්ණ ගැන්වීම | 2017.04.03 - 2017.04.03 | 3 | කටුබැද්ද අංශය | 11 |
| 5 | අන්තර් අවකාශ නිර්මාණය | 2017.04.19 - 2017.04.21 | 3 | කටුබැද්ද අංශය | 17 |
| 6 | ලෙනෝ වියමන් මෝස්තර | 2017.04.24 - 2017.04.27 | 4 | කටුබැද්ද අංශය | 27 |
| 7 | ස්වභාවික වර්ණ ආශ්‍රිත නූල් වර්ණ ගැන්වීම | 2017.05.03 - 2017.05.05 | 3 | කටුබැද්ද අංශය | 30 |
| 8 | වෝප් ප්‍රින්ටින් | 2017.05.15 - 2017.05.17 | 3 | කටුබැද්ද අංශය | 18 |
| 9 | පල්ලු වියමන් මෝස්තර | 2017.05.22 - 2017.05.25 | 4 | කටුබැද්ද අංශය | 19 |
| 10 | අගය එකතුකළ භාණ්ඩ නිෂ්පාදනය | 2017.05.29 - 2017.05.31 | 3 | කටුබැද්ද අංශය | 11 |
| 11 | ක්‍රමවත් පරිදි වෝප් දැමීම සහ මල්බෑම | 2017.07.16 | 1 | කටුබැද්ද අංශය | 15 |
| 12 | දුම්බර රටා මෝස්තර නිර්මාණය | 2017.06.02 - 2017.06.07 | 4 | කටුබැද්ද අංශය | 21 |
| 13 | පෙතම්පිළි මෝස්තර | 2017.06.12 - 20017.06.21 | 8 | කටුබැද්ද අංශය | 22 |
| 14 | දික්ජාලා මෝස්තර | 2017.07.04 - 2017.07.07 | 4 | කටුබැද්ද අංශය | 15 |
| 15 | ක්ෂේත්‍ර චාරිකා | 2017.07.18 | 1 | කොට්ටල පේෂ පාසල | 12 |
| 16 | ක්ෂේත්‍ර චාරිකා | 2017.07.21 | 1 | බණ්ඩාරවෙල පේෂ පාසල | 17 |
| 17 | ක්ෂේත්‍ර චාරිකා | 2017.07.20 | 1 | කිරම පේෂ පාසල | 9 |
| 18 | ක්ෂේත්‍ර චාරිකා | 2017.07.20 | 1 | මාතර පේෂ පාසල | 9 |
| 19 | ක්ෂේත්‍ර චාරිකා | 2017.07.21 | 1 | පින්නවල පේෂ පාසල | 18 |
| 20 | ක්ෂේත්‍ර චාරිකා | 2017.08.08 | 1 | බෝයගනේ පේෂ පාසල | 19 |
| 21 | පළාත් අධ්‍යක්ෂවරුන්ගේ ක්ෂේත්‍ර දැනුම වර්ධනය | 2017.08.29 | 1 | TITP-කොළඹ | 60 |
| 22 | ක්ෂේත්‍ර චාරිකා | 2017.08.16 | 1 | කටුබැද්ද පේෂ පාසල | 12 |
| 23 | ක්ෂේත්‍ර චාරිකා | 2017.08.08 | 1 | මාතලේ පේෂ පාසල | 21 |
| 24 | ක්ෂේත්‍ර චාරිකා | 2017.08.29 | 1 | ගැටඹේ පේෂ පාසල | 15 |
| 25 | ක්ෂේත්‍ර චාරිකා | 2017.08.19 | 1 | තලාව පේෂ පාසල | 9 |

| අනු අංකය | පාඨමාලාවේ නම | පැවැත්වූ දිනය | දින ගණන | පැවැත්වූ ස්ථානය/සහභාගිත්වය | සහභාගිවූ සංඛාව |
|---|---|---|---|---|---|
| 26 | කැච්කාඩ් මෝස්තර නිර්මාණය | 2017.09.21 - 2017.09.25 | 4 | කටුබැද්ද අංශය | 13 |
| 27 | ඩොබ් මෝස්තර නිර්මාණය | 2017.09.11 - 2017.09.20 | 8 | කටුබැද්ද අංශය | 17 |
| 28 | පේෂ පාසැල් සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය (පළමු කණ්ඩායම) | 2017.09.15 | 1 | කොට්ටල පේෂ පාසල | 81 |
| 29 | පේෂ පාසැල් සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය (දෙවන කණ්ඩායම) | 2017.09.22 | 1 | කටුබැද්ද අංශය | 66 |
| 30 | පේෂ පාසැල් සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය (තෙවන කණ්ඩායම) | 2017.09.29 | 1 | කොට්ටල පේෂ පාසල | 63 |
| 31 | සේවා ඵලදායීතාව වැඩි කිරීමේ වෘත්තීය කාර්යය සාධනය | 2017.10.20 | 1 | කටුබැද්ද අංශය | 50 |
| 32 | අගය එකතුකළ භාණ්ඩ නිෂ්පාදනය | 2017.10.24 - 2017.10.27 | 4 | වැලිමඑව | 31 |
| 33 | නියමිත ප්‍රමිතියෙන් යුතුව රෙදි නිෂ්පාදනය කිරීම | 2017.11.08 - 2017.11.11 | 4 | කුලියාපිටිය | 30 |
| 34 | නිවැරදිව රෙදි විවීමේ ප්‍රායෝගික ක්‍රම, මෝස්තර නිර්මාණය | 2017.11.09 - 2017.11.14 | 4 | කෑගල්ල | 29 |
| 35 | විවිධසාරි මෝස්තර නිර්මාණය | 2017.11.14 - 2017.11.17 | 4 | දියගම | 28 |
| 36 | පල්ලු සාරි මෝස්තර නිර්මාණය | 2017.11.27 - 2017.11.30 | 4 | ගොඩවෙල | 32 |
| 37 | සාරි මෝස්තර නිර්මාණය හා වර්ණ සංයෝජනය | 2017.12.21 - 2017.12.24 | 4 | මාතර පේෂ පාසල | 31 |
| 38 | IIHT පුහුණුව (පළමු) | 2017.08.06 - 2017.08.15 | 10 | ඉන්දියාව | 22 |
| 39 | IIHT පුහුණුව (දෙවන) | 2017.12.05 - 2017.12.24 | 20 | ඉන්දියාව | 15 |
| | | එකතුව | | | **978** |






## 6 විභාග පැවැත්වීම

<u>පේෂකර්මාන්ත පුහුණු පාඨමාලා සම්බන්ධ විභාග කටයුතු</u>

- පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර හා මූලික පුහුණු පාඨමාලාවන්ට අදාළ විභාග කටයුතු 2017 ජුලි මස 26-28 දිනයන්හි පවත්වන ලදි. මේ සඳහා පේෂ පාසල් සිසුන් **145** දෙනෙකු හා බාහිර අයදුම්කරුවන් **46** දෙනෙකු පෙනී සිටි අතර පේෂ පාසල් සිසුන් දෙදෙනෙකු හා බාහිර අපේක්ෂකයින් **09** දෙනෙකු විභාගය සඳහා සහභාගි නොවීය.

| විභාග මධ්‍යස්ථානය | පේෂ පාසල් සිසුන් | | බාහිර අයදුම්කරුවන් | |
|---|---|---|---|---|
| | පැමිණි | නොපැමිණි | පැමිණි | නොපැමිණි |
| කොට්ටල | 08 | - | - | - |
| කටුබැද්ද | 12 | 01 | 11 | - |
| ගැටඹේ | 13 | - | 01 | - |
| කිරම | 06 | - | - | - |
| බෝයගනේ | 18 | - | - | 02 |
| මාතලේ | 14 | - | 01 | - |
| බණ්ඩාරවෙල | 15 | - | 06 | 01 |
| මාතර | 05 | - | 01 | - |
| වටපුළුව | 20 | - | 02 | - |
| පින්නවල | 15 | - | 01 | - |
| තලාව | 06 | 01 | - | - |
| සමන්තුරේ | 07 | - | 17 | 04 |
| නල්ලූර් | 06 | - | 06 | 02 |
| එකතුව | **145** | **02** | **46** | **09** |
| | **147** | | **55** | |

- එක් අවුරුදු මෝස්තර පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා 2017 ජනවාරි මස බඳවා ගන්නා ලද සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන පරීක්ෂණය 2018 ජනවාරි මස 24, 29,30 යන දිනයන්හි පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැළසුම් කරන ලදි. ඒ සඳහා ගැටඹේ මෝස්තර පුහුණු පාසලේ සිසුන් 10 දෙනෙකු හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසලේ සිසුන් 09 දෙනෙකු පෙනී සිටීමට නියමිතය.

<u>දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග</u>

- දෙපාර්තමේන්තුවේ පේෂ උපදේශක තනතුරෙහි සේවය කරන නිලධාරීන් 28 දෙනෙකු සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **2017-03-25** වන දින දෙපාර්තමේන්තුවේ කටුබැද්ද අංශයේදී පවත්වන්නට යෙදිනි.

## 07 පුහුණු හා හැකියා වර්ධන කටයුතු

**2017 වර්ෂය තුළ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණු අවස්ථා/ සහභාගි වූ වැඩමුළු පිළිබඳ විස්තර පහත පරිදි වේ.**

| පුහුණු පාඨමාලාව / වැඩසටහන | පුහුණුකාලය/ වැඩසටහන පැවැත්වූ කාලය | දේශීය/ විදේශීය | සහභාගි වූ නිලධාරින් ගණන |
|---|---|---|---|
| පොත් බැඳුම්කරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව (ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව) | 2017.08.21 – 2017.10.03 | **දේශීය** | **01** |
| ලේඛන කළමණාකරණය හා සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව (ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 2017.08.21 – 2017.08.25 | **දේශීය** | **02** |
| දෙපාර්තමේන්තු හා විශේෂ පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගි කර ගැනීම (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය) | 2017.11.28 | **දේශීය** | **01** |
| අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ විධායක සහ අධීක්ෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුව **(ඉන්දියානු පේෂකර්ම තාක්ෂණ ආයතනය , සේලම් - ඉන්දියාව)** | 2017.08.06 – 2017.08.15 | **විදේශීය** | **22** |
| අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ පේෂ උපදේශකයන් සඳහා පුහුණු වැඩමුළුව **(ඉන්දියානු පේෂකර්ම තාක්ෂණ ආයතනය , සේලම් - ඉන්දියාව)** | 2017.12.05 – 2017.12.24 | **විදේශීය** | **15** |

08 රජය මඟින් දහම් පාසල් ගුරුවරුන් වෙත නොමිලේ බෙදා දෙනු ලබන දහම් පාසල් සාරි 72,000 ක් සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයට අදාළව ලබා දුන් ඇණවුම, පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නිෂ්පාදකයින් මඟින් පහත සඳහන් පරිදි සම්පූර්ණ කර ලබා දෙන ලදි.

| | සැපයුම්කරු | සපයන ලද සාරි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සී/ස මරදගහමුල පේෂකර්ම සමුපකාර සමිතිය | 11,000 |
| 02 | හෙලසළු වීවින් | 7,000 |
| 03 | කැන්ඩි ෆැබ්රික් (පුද්.) සමාගම | 6,000 |
| 04 | සන්ටෙක්ස් වීවින් ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම | 14,000 |
| 05 | ඩී.ජේ.ප්‍රඩක්ට්ස් | 1,600 |
| 06 | සී/ස ශ්‍රී ලංකා පේෂකාර්මිකයින්ගේ සමුපකාර සංගමය | 3,900 |
| 07 | ජයසළු වීවින් | 1,000 |
| 08 | ඉහල මඩම්පැල්ල අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ශල්‍ය ගෝස් නිෂ්පාදනයකිරීමේ සමුපකාර සමිතිය | 7,000 |
| 09 | කොට්ටල ලිය සහන අත්යන්ත්‍ර පේෂකර්ම සුභ සාධක සමිතිය | 6,000 |
| 10 | දිලිනි සහ මධුෂි නිෂ්පාදන | 1,000 |
| 11 | ඔරයන් ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් | 6,000 |
| 12 | වේයන්ගොඩ පේෂකර්ම සමුපකාර සමිතිය | 6,000 |
| 13 | රිෂ්මි සවිත් ටෙක්ස්ටයිල් | 500 |
| 14 | නිලංකා වීවින් | 500 |
| 15 | ලක්ෂ්මන් ඉන්ඩස්ට්‍රීස් | 500 |
| | එකතුව | 72,000 |

09 වඩාත් ඵලදායී ජීවනෝපාය මාර්ගයක් ලෙස අත්යන්ත්‍ර ජේෂකර්මාන්තය ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්තකරලීමේ අරමුණෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ජේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි අත්යන්ත්‍ර ජේෂකර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කරන ලදි.

අදාළ ප්‍රදේශවල තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා අත්යන්ත්‍ර ජේෂ කර්මාන්තය පිළිබඳ මාස හයක පුහුණුව ලබා දීමෙන් පසු කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර, මූලික උපකරණ හා අමුද්‍රව්‍ය නොමිලේ ලබා දීමෙන් අනතුරුව පුහුණුව ලද ප්‍රතිලාභීන් කර්මාන්තගත කිරීමට කටයුතු කරන අතර කර්මාන්තයේ නිරත දේශීය නිෂ්පාදකයන් දිරි ගැන්වීමේ අරමුණෙන් ඔවුන් සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර උපකරණ නොමිලේ බෙදාදීම සිදු කරනු ලැබේ.

| ව්‍යාපෘතිය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා/ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන (2017-12-31 දිනට) | පුහුණුව ආරම්භ කළ දිනය | පුහුණුව අවසන් වන දිනය |
|---|---|---|---|---|---|---|
| කකුරුගොල්ල අරාව | ඌව | මොණරාගල | බිබිල | 09 | 2017.09.07 | 2018.03.06 |
| මුඩගමුව | ඌව | බදුල්ල | කන්දෙකැටිය | 14 | 2017.09.26 | 2018.03.25 |
| යටියන | බස්නාහිර | ගම්පහ | මිනුවන්ගොඩ | 10 | 2017.10.02 | 2018.04.01 |
| ඉහළගම | බස්නාහිර | ගම්පහ | දිවුලපිටිය | 08 | 2017.07.19 | 2018.01.18 |
| වැලිකන්න | බස්නාහිර | කොළඹ | සීතාවක | 12 | 2017.08.31 | 2018.02.28 |
| ගනේවත්ත | වයඹ | කුරුණෑගල | ගනේවත්ත | 12 | 2017.12.03 | 2018.06.02 |
| උඩතලවින්න | මධ්‍යම | මහනුවර | පාතදුම්බර | 06 | 2017.10.02 | 2018.04.01 |
| මීගහජඳුර | දකුණ | හම්බන්තොට | සූරියවැව | 04 | 2017.10.16 | 2017.04.15 |
| වේපතඉර | දකුණ | මාතර | හක්මන | 12 | 2017.09.04 | 2018.03.03 |
| කටුඅත්තාමඩ | මධ්‍යම | මාතලේ | උකුවෙල | 13 | 2017.09.19 | 2018.04.18 |











10 තවද 2017 වර්ෂයේදී,

- පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන පේෂකර්මාන්ත පුහුණු පාසල්, ව්‍යාපෘති මධ්‍යස්ථාන හා අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති සඳහා අවශ්‍ය නූල් හා උපකරණ ද ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ උපකරණ ද මිලදී ගැනීම

- පේෂකර්මාන්ත පුහුණු පාසල්වල පේෂකර්මාන්ත පුහුණු පාඨමාලාව හදාරන සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව පැවැත්වීම

- පේෂකර්මාන්ත පුහුණු පාසල්හි ඉගෙනුම ලබන සියළුම සිසුන් සඳහා නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දීම

- දෙපාර්තමේන්තුවට අයත් NB – 3003, PD-4265, KC-7670, 51-5959 වාහන අලුත්වැඩියාව

- පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය නිර්මාණය සම්බන්ධ කටයුතු

- ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහභාගි වන දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා නිල ඇඳුමක් සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදි.

# පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව - භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2017

ඇමුණුම i

| | ක්‍රියාකාරකම | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කළ මුදල (රු.මි.) | වියදම (රු.මි.) | |
| **2001** | ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම | ආයතන 09ක ගොඩනැගිලි අලුත්වැඩියාව | සේවා ඵලදායිතාව | ▪ කටුබැද්ද,අධ්‍යක්ෂ නිල නිවසේ ප්‍රතිසංස්කරණ කටයුතු<br>▪ කටුබැද්ද, බෝයගනේ, සමන්තුරේ, කිරම, මාතර පේෂ කර්මාන්ත පුහුණු පාසල්හි අලුත්වැඩියා කටයුතු<br>▪ කටුබැද්ද පරිශ්‍රයේ වෙනත් සංවර්ධන කටයුතු<br>▪ රාජගිරිය ස්වාභාවික වර්ණ මධ්‍යස්ථාන පරිශ්‍රයේ ඉදිකිරීම්<br>▪ නුවරඑළිය ශාන්තිපුර සංචාරක නිවාසයේ අලුත්වැඩියා කටයුතු | 5.000 | 2.552 | 51% |
| **2003** | වාහන අලුත්වැඩියාව | වාහන 04 අලුත්වැඩියාව | කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ලබාදීම | 2017 වර්ෂය තුළ පහත සඳහන් වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීම<br>NB – 3003, PD-4265, KC-7670, 51-5959 | 0.650 | 0.579 | 89% |
| **2102** | කාර්යාලයීය අවශ්‍යතා | සේවා කාර්යක්ෂමතාවය හා ඵලදායිත්වය | කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් ලබාදීම | වර්ෂය තුළ කාර්යාල උපකරණ, පරිගණක හා පරිගණක උපාංග, ෆැක්ස් යන්ත්‍ර, කටුබැද්ද අංශය සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය, පේෂ පාසල් සඳහා උපකරණ, අධ්‍යක්ෂ නිල නිවස සඳහා උපකරණ මිලදී ගැනීම | 1.300 | 1.294 | 100% |

ඇමුණුම ii

| | ක්‍රියාකාරකම | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කළ මුදල (රු.මි.) | වියදම (රු.මි.) | |
| | **<u>අත්යන්ත්‍ර ක්ෂේත්‍රයේ පුහුණුව හා හැකියා වර්ධනය</u>** | | | | | | |
| **2401-1** | පේෂකර්මාන්ත පුහුණු පාසල් සිසුන් සඳහා නිල ඇඳුම් සැපයීම | සිසුන් 192 | පේෂ පාසල් සඳහා සිසුන් ආකර්ෂණය කිරීම | සිසුන් 192 දෙනෙකු සඳහා නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබාදීම | 0.500 | 0.498 | 100% |
| **2401-2** | ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය හා අලෙවි සල්පිල | අලෙවි කුටි 36 පළාත්සභා 09 පෞද්ගලික ව්‍යවසායකයන් | අත්යන්ත්‍ර රෙදිපිළි ව්‍යවසායකයන් සඳහා අලෙවි පහසුකම් ප්‍රවර්ධනය | 2017 දෙසැ. මස 15-17 දිනවල බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේදී අත්යන්ත්‍ර ප්‍රදර්ශනය හා අලෙවි සල්පිල පැවැත්වීම | 9.800 | 8.599 | 88% |
| **2401-3** | පේෂ පාසල් හා මෝස්තර පාසල් සිසුන් සඳහා පැමිණීමේ දීමනා ගෙවීම | සිසුන් 200 | පේෂ පාසල් සඳහා සිසුන් - 175<br>මෝස්තර පුහුණු පාසල් සඳහා සිසුන් - 25 | (i) පේෂ කර්මාන්ත පුහුණු පාසල්<br><u>අධ්‍යයන වර්ෂය</u> <u>බඳවාගත් සිසුන්</u><br>2016/2017<br>(2016.07.04 – 2017.07.31) 157<br>2017/2018<br>(2017.07.03 – 2018.07.31) 192<br>(ii) මෝස්තර පුහුණු පාසල්<br><u>අධ්‍යයන වර්ෂය</u> <u>බඳවාගත් සිසුන්</u><br>(2017.01.10)<br>2017 21 | 4.000 | 3.442 | 86% |
| **2401-4** | පේෂ පාසල් හා මෝස්තර පුහුණු පාසල් සඳහා නූල් සහ උපකරණ මිලදී ගැනීම | නූල් සහ අත්යන්ත්‍ර උපාංග | ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යාපන ප්‍රවර්ධනය | පේෂ පාසල් 14 සහ මෝස්තර පුහුණු පාසල් 02 සඳහා නූල් සහ අදාළ උපකරණ සැපයීම | 1.000 | 0.270 | 27% |

| | ක්‍රියාකාරකම | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කළ මුදල (රු.මි.) | වියදම (රු.මි.) | |
| **2401-5** | ඉංග්‍රීසි භාෂා හැකියා ප්‍රවර්ධනය සඳහා සම්පත්දායකයින්ට ගෙවීම් කිරීම | සිසුන් 200කගේ භාෂා ඥාන වර්ධනය | පුහුණුවන්නන්ගේ භාෂා දැනුම වර්ධනය කිරීම | පේෂ කර්මාන්ත පුහුණු පාසල්හි සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව පැවැත්වීම | 0.500 | 0.429 | 86% |
| **2401-6** | සේවාස්ථ පුහුණු වැඩසටහන් | පුහුණුලාභීන් 978 | පුහුණුලාභීන් 978කගේ හැකියා වර්ධනය, සේවා කාර්යක්ෂමතාව,ඵලදායිතා වය සහ විෂයානුබද්ධ දැනුම වැඩිදියුණු කිරීම | පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන් 19ක්, නිපුණතා සංවර්ධන වැඩසටහන් 05ක්, පේෂ පාසල් සිසුන් සඳහා පෞරුෂත්ව වැඩසටහන් 03 ක්, අත්යන්ත්‍ර පේෂකර්මාන්තයට අදාළ විදේශ පුහුණු වැඩසටහන් 02ක් හා අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකා 10 කි.<br>( දෙපාර්තමේන්තු නිලධාරීන්, පේෂ පාසල් සිසුන්, පළාත්සභා ආයතන, සමුපකාර සමිතිවල හා පෞද්ගලික අංශයේ පුහුණුලාභීන් 978 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 39ක් පවත්වා ඇත. | 1.50 | 1.147 | 76% |
| | **<u>ප්‍රවර්ධන ක්‍රියාකාරකම්</u>** | | | | | | |
| **2401-7** | අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි සල්පිල පැවැත්වීම<br><br>දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා නිල ඇඳුම් සැපයීම | අලෙවි කුටි 36, ප්‍රචාරණාත්මක පුවත්පත් (දිවයින පුරා)<br><br>දෙපාර්තමේන්තු නිලධාරීන් - 122 | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය<br><br>සේවක අභිප්‍රේරණය | අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත අලෙවි සල්පිල 2017 මාර්තු 7 – 9 දිනවල බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේදී පැවැත්විණි<br>ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහභාගි වන නිලධාරීන් 122 දෙනෙකු සඳහා නිල ඇඳුම් ලබාදීම (වියදමෙන් කොටසක් දෙපාර්තමේන්තුව විසින් දැරීම) | 5.550 | 3.66 | 66% |

| | ක්‍රියාකාරකම | මිණුම් ඒකකය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කළ මුදල (රු.මි.) | වියදම (රු.මි.) | |
| 2401-8 | පේෂ පාසල් සඳහා උපකරණ ලබාදීම සහ පරිපාලන වියදම් දැරීම | පේෂ පාසල් අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය (පේෂ පාසල් - 14, මෝස්තර පුහුණු පාසල් - 02) | ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය (පේෂ පාසල් - 14, මෝස්තර පුහුණු පාසල් - 02) | පේෂ පාසල්, මෝස්තර පුහුණු පාසල් හා පාසල් නේවාසිකාගාර සඳහා උපකරණ මිලදී ගැනීම හා පරිපාලන වියදම් දැරීම | 1.800 | 1.550 | 86% |
| 2401-9 | වාර්ෂික විභාග පැවැත්වීම (පේෂ පාසල්/මෝස්තර පුහුණු පාසල්/ දෙපාර්තමේන්තු විභාග) | පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගයේ අයදුම්කරුවන් 202 දෙපාර්තමේන්තු පේෂ උපදේශක නිලධාරීන් 28 | ගුණාත්මක තාක්ෂණ ශිල්පීන් බිහිකිරීම | (i) පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගය පැවැත්වීම - 2017 ජූලි 26-28 (පේෂ පාසල් සිසුන් 145 හා බාහිර අයදුම්කරුවන් හා නැවත පෙනී සිටින සිසුන් 46 ක් පෙනී සිටින ලදි. (පේෂ පාසල් සිසුන් 02 හා බාහිර අපේක්ෂකයන් 09 දෙනෙකු විභාගය සඳහා සහභාගි නොවිය)<br>(ii) අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර නිර්මාණය පිළිබඳ උසස් පුහුණු සහතිකපත්‍ර විභාගය - 2016 (2017 ජනවාරි 25 - 27/ සිසුන් 19)<br>(iii) පේෂ උපදේශක නිලධාරීන් 28 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2017-03-25 දින පැවැත්විය. | 0.400 | 0.292 | 73% |
| 2401-10 | සංවර්ධන ක්‍රියාකාරකම් | වෙබ් අඩවිය පරිශීලනය කරන්නන් සංඛ්‍යාව | අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීම | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය නිර්මාණය හා නඩත්තුව | 4.450 | 0.185 | 4% |
| | **සමස්ත ප්‍රගතිය** | | | | **36.450** | **24.505** | |

**2401** සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ රු: **5,318,202.49** ක නොගෙවූ බිල්පත් සඳහා ජනවාරි මාසයේදී ගෙවීම් කර ඇත. නොගෙවූ බිල්පත් සමඟ මුළු ප්‍රාග්ධන වැඩසටහන්වල ප්‍රගතිය **82%** කි.